සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 10 ශ්‍රේණිය

## බුද්ධ ධර්මය - I

**නම/විභාග අංකය :-** ................................................................................................ **කාලය : පැය 03 යි.**

සැලකිය යුතුයි:

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය (X) ලකුණ යොදන්න.

1. සුදොවුන් රජතුමාගේ එකම සිහිනය වූයේ තම පුත් සිදුහත් කුමරා,
   1. බුද්ධත්වයට පත්වනු දැකීමයි.
   2. සක්විති රජකෙනෙකු වනු දැකීමයි.
   3. ඉවසීමෙන් කටයුතු කරනු දැකීමයි.
   4. අභියෝග ජයගනු දැකීමයි.

2. බෞද්ධයකු වීමේ පළමු පියවර වන්නේ,
   1. පන්සිල් සමාදන් වීමයි.
   2. තෙරුවන් සරණ යාමයි.
   3. බුදුන් වැඳීමයි.
   4. භක්තියෙන් කටයුතු කිරීමයි.

3. අප තෙරුවන් සරණ යා යුත්තේ,
   1. භක්තිය මුල්කරගෙනය.
   2. ප්‍රඥාව මුල්කරගෙනය.
   3. ශ්‍රද්ධාවත් ප්‍රඥාවත් මුල්කරගෙනය.
   4. ශ්‍රද්ධාවත් භක්තියත් මුල්කරගෙනය.

4. රහසත් පව් නොකොට.... යන කවිය ඇතුළත් ග්‍රන්ථය වන්නේ,
   1. ලෝවැඩ සඟරාව.
   2. බුදුගුණ අලංකාරය.
   3. තුන් සරණය.
   4. සුභාෂිතය.

5. ඥාතීන් ඉදිරියේ දක්ෂ ලෙස ශිල්ප දක්වීම, භද්‍ර යෞවනයේදීම සක්විති රජකම, යසෝදරාව හා පුත් කුමරා අතහැර ගොස් පැවිදිවීම යනාදී අවස්ථාවලින් ප්‍රකට වන්නේ සිදුහත් බෝසතාණන් වහන්සේ,
   1. අභියෝග ජයගත් ආකාරයයි.
   2. නිර්භීතව කටයුතු කළ ආකාරයයි.
   3. ලෝ වැසියන් සතුටු කළ ආකාරයයි.
   4. ආදර්ශවත්ව කටයුතු කළ ආකාරයයි.

6. ආර්ය සත්‍යය අවබෝධ කරගෙන සම්පූර්ණයෙන්ම දුකින් එතෙරවීමේ මං පෙත් විවර වනුයේ,
   1. පන්සිල් රැකීමෙනි.
   2. ආජීව අෂ්ටමක සීලය රැකීමෙනි.
   3. බුදුන් සරණ යාමෙනි.
   4. තෙරුවන් සරණ යාමෙනි.

7. භාවනාව වඩන පුද්ගලයා ආචාර්යවරයකුගේ උපදෙස් ලබාගෙන තම චරිතයට ගැළපෙන කර්මස්ථානයක් තෝරා ගත යුතුය. එසේ තෝරා ගත හැකි අරමුණු හෙවත් කර්මස්ථාන ගණන,
   1. තිහකි.
   2. හතළිහකි.
   3. පනහකි.
   4. පහකි.

8. සියලු කෙලෙස් මුළුමනින්ම නැති කොට ලබන නොබිඳෙන චිත්ත පාරිශුද්ධිය තුළින්ම ඇති තතු ඇති සැටියෙන් දැකීම හඳුන්වන්නේ,

1. ප්‍රඥාව නමිනි. 2. විදර්ශනාඥාණය නමිනි.
3. සමාධිය නමිනි. 4. අනාත්ම නමිනි.

9. තෙරුවන ගුණ ප්‍රමාණය

1. තුනකි. 2. හයකි. 3. විසිහතරකි. 4. නවයකි.

10. නිර්වාණාවබෝධය සඳහා ඉවහල්වන භාවනාව වන්නේ,

1. සමථ භාවනාව. 2. විදර්ශනා භාවනාව. 3. බුද්ධානුස්සති භාවනාව. 4. ආනාපානසති භාවනාව.

11. ලක්දිව බුදු සසුන නගා සිටුවීමට කරන ලද සුවිශේෂ මෙහෙවරට උපහාර වශයෙන් වැලිවිට සරණංකර හිමියන්ට සඟරජ පදවිය පිරිනැමුවේ,

1. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා. 2. ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා.
3. දුටුගැමුණු රජතුමා. 4. දෙවන රාජසිංහ රජතුමා.

12. ''මාගේ මේ ව්‍යායාමය බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස මිස කිසි කලෙකත් රජ සැප පිණිස නොවන්නේ ය'' යන සටන් පාඨයට අනුව රටදැය නගා සිටුවීමට කටයුතු කළේ,

1. දෙවනපෑතිස් රජතුමා. 2. අනගාරික ධර්මපාලතුමා.
3. ධර්මාශෝක රජතුමා. 4. දුටුගැමුණු රජතුමා.

13. යම් ක්‍රියාවකට නුවණැති අය නින්දා කරත් නම් එබඳු කුඩා වූ වරදකින් පවා වැළකිය යුතුබව දක්වා ඇත්තේ,

1. මහා මංගල සූත්‍රයේ ය. 2. කරණීය මෙත්ත සූත්‍රයේ ය.
3. මහා නිදාන සූත්‍රයේ ය. 4. සිගාලෝවාද සූත්‍රයේ ය.

14. ''පසන්'' දුසිරිත් කරන අය අතරේ සිටිය ද සුසිරිත් වඩයි. අකුසල් කරන අය අතර කුසල් කරයි. පව් කරන අය අතර පිංකම් කරයි. ඔහු උත්සාහ කරන්නේ,

1. කීර්තිය ලබාගැනීමටයි. 2. සිල්වත් වීමටයි.
3. පද්මාකාර ජීවිතයක් ගතකිරීමටයි. 4. සහජීවනයෙන් සිටීමටයි.

15. සියලු ජාතීහු සාමයෙන් සමගියෙන් සහයෝගයෙන් ජීවත්වීම හඳුන්වන්නේ,

1. සහජීවනය ලෙසයි. 2. සමානාත්මතාව ලෙසයි.
3. සමගි සම්පන්න බව ලෙසයි. 4. සහනසීලීදායක බව ලෙසයි.

16. බුදු දහමේ සඳහන් සිවු සඟරාවත වන්නේ,

1. මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා ය. 2. දානය, ප්‍රිය වචනය, අර්ථ චර්යාව, සමානාත්මතාව ය.
3. ඡන්ද, චිත්ත, විරිය, විමංසා ය. 4. ඡන්දය, ද්වේශය, භය, මෝහය ය.

17. ''සමවායෝ එව සාධු....'' යන්නෙහි අදහස වන්නේ,

1. සමගිවීම සාධු චර්යාවක් යන්නය. 2. සමගි වන්න විවාද නොකරන්න යන්නය.
3. සමගියම යහපති යන්නය. 4. සමගියෙන් විවාද කරන්න යන්නය.

18. බුදු රජාණන් වහන්සේ මංගල ධර්ම දේශනය පැවැත්වූයේ,

1. බරණැස ඉසිපතනයේ මිගදායේදී ය. 2. රජගහනුවර සප්තපර්ණී ගුහා ද්වාරය අභියසදී ය.
3. රජගහනුවර වේළුවනාරාමයේදී ය. 4. සැවැත් නුවර ජේතවනාරාමයේදී ය.

19. පරලොවක් නැත යන පිළිගැනීම මත මෙලොව වශයෙන් හැකිතාක් කම්සැප විඳීමට ඇති ආශාව හඳුන්වන්නේ,

1. කාම තණ්හාව නමිනි. 2. භව තණ්හාව නමිනි. 3. විභව තණ්හාව නමිනි. 4. ත්‍රිවිධ තණ්හාව නමිනි.

20. බුදු රජාණන් වහන්සේ දෙවන වස්කාලය ගතකළේ,

1. වේළුවනාරාමයේ ය. 2. ජේතවනාරාමයේ ය. 3. ඉසිපතනේ මිගදායේ ය. 4. පරිලෙය්‍ය වනයේ ය.

21. ත්‍රිවිධ රත්නය කෙරේ අසීමිත ශ්‍රද්ධාවෙන් යුතුවීම, ශික්ෂාකාමීව හා අල්පේච්ඡව ජීවත්වීම, දුෂ්කරතා මැද වුව ද අධ්‍යාපනය පිළිබඳ දැඩි සැලකිල්ලක් දැක්වීම, සිසු දරුවන්ට උදවු වීමට කැමතිවීම යනාදී ආදර්ශ අපට ලබාගත හැකි චරිත වන්නේ,

1. දුටුගැමුණු රජතුමා. 2. වැලිවිට සරණංකර හිමියන්.
3. කීර්ති ශ්‍රී රාජසිංහ රජු. 4. දෙවනපැතිස් රජු.

22. ''යේ ධම්මා හේතුප්පභවා.....'' යන ගාථාවෙහි ඇතුළත් මූලික ඉගැන්වීම වන්නේ,

1. බුද්ධකාරක ධර්මය. 2. හේතුඵල ධර්මය. 3. සප්ත අපරිහානීය ධර්මය. 4. සේඛියා ධර්මය.

23. බුදු රජාණන් වහන්සේ දේශනා කළ පරිදි සිල් රැකීමෙන් මෙලොවදී ලැබෙන ආනිසංස ගණන,

1. හතරකි. 2. පහකි. 3. තුනකි. 4. හතකි.

24. තමා විසින් කරන ලද යහපත් ක්‍රියා පිං පොතක ලියා තැබුවේ,

1. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා. 2. දුටුගැමුණු රජතුමා.
3. වැලිවිට සරණංකර හිමි. 4. දෙවනපැතිස් රජතුමා.

25. ''තරුණ වියේදී උතුම් ශීලා දී ගුණ ධර්ම නොපිරීමෙන් දුන්නෙන් විදි ඊතලයක් වනයේ වැටී දිරාපත් වන්නාක් මෙන් මහලු වියට පත් වූ විට සුසුම් ලති.'' යන අදහස දැක්වෙන ධම්මපද ගාථාවේ මුල් පදය හා අග පදය වන්නේ,

1. අචරිත්වා බ්‍රහ්මචරියං - ඛීණ මච්ඡෙව පල්ලලේ 2. අචරිත්වා බ්‍රහ්මචරියං - පුරාණානි අනුත්ථුනං
3. තං ච කම්මං කතං සාධු - විපාකං පටිසේවති 4. උට්ඨානවතෝ සතිමතෝ - අප්පමත්තස්ස යසෝභිවඩ්ඪති

26. බෞද්ධයන්ගේ අත්පොත ලෙස සැලකෙන ධම්මපදය අයත් වන්නේ සූත්‍ර පිටකයේ,

1. ඛුද්දක නිකායට ය. 2. සංයුක්ත නිකායට ය. 3. අංගුත්තර නිකායට ය. 4. මජ්ඣිම නිකායට ය.

27. වෙනත් කර්මයකින් වළකාලිය නොහැකි වඩාත් ශක්තිමත් කුසලා කුසල කර්මයෝ හඳුන්වන්නේ,

1. ගරුක කර්ම නමිනි. 2. ආසන්න කර්ම නමිනි. 3. ආචිණ්ණ කර්ම නමිනි. 4. ජනක කර්ම නමිනි.

28. ධම්මික උපාසකතුමා මරණාසන්න මොහොතේ සුගතිය දැක සිහියෙන් යුතුව කලුරිය කළේය. එයට හේතුව වූයේ,

1. පෙර කරන ලද කුසල කර්ම හේතුවෙනි. 2. සිල් රැකීමේ ආනිසංස හේතුවෙනි.
3. දිට්ඨ ධම්ම වේදනීය කර්ම හේතුවෙනි. 4. ආසන්න බණ ඇසීම හේතුවෙනි.

29. සිගාලෝවාද සූත්‍රයට අනුව උඩ දිශාවෙන් දක්වා ඇත්තේ,

1. ගුරුවරුය. 2. දෙමාපියන්ය. 3. පැවිදි උතුමන්ය. 4. හිතමිතුරන්ය.

30. ''මාතා පිතා දිසා පුබ්බා....'' යන ගාථාව සඳහන් වන්නේ,

1. පරාභව සූත්‍රයේ ය.
2. චූල්ල කම්ම විභංග සූත්‍රයේ ය.
3. මහා මංගල සූත්‍රයේ ය.
4. සිගාලෝවාද සූත්‍රයේ ය.

31. දස අකුසල් අතර කයින් සිදුකරන අකුසල් වන්නේ,

1. ප්‍රාණඝාතය, අදත්තාදානය, සම්පප්පලාප.
2. අභිධ්‍යාව, ව්‍යාපාදය, මිථ්‍යාදෘෂ්ටිය.
3. ප්‍රාණඝාතය, ව්‍යාපාදය, මිථ්‍යාදෘෂ්ටිය.
4. ප්‍රාණඝාතය, අදත්තාදානය, කාමමිථ්‍යාචාරය.

32. දෙවන ආත්ම භවයෙන් පසු කවර හෝ ආත්මභාවයක විපාක දෙන කර්ම හඳුන්වන්නේ,

1. උපපජ්ජ වේදනීය කර්ම යනුවෙනි.
2. අපරාපරිය වේදනීය කර්ම යනුවෙනි.
3. ආචිණ්ණ කර්ම යනුවෙනි.
4. කටත්තා කර්ම යනුවෙනි.

33. මට්ඨකුණ්ඩලී නම් තරුණයා මරණාසන්න මොහොතේ බුදුන් වහන්සේ දැක සිත පහදවාගත් පිනෙහි ප්‍රතිඵලයක් ලෙස දිව්‍ය ලෝකයේ උපත ලැබුවේ,

1. ආසන්න කර්මයට අනුරූපවය.
2. ආචිණ්ණ කර්මයට අනුරූපවය.
3. උපපජ්ජවේදනීය කර්මයට අනුරූපවය.
4. ජනක කර්මයට අනුරූපවය.

34. ''හරිදූ'' ස්ථානෝචිත ප්‍රඥාවෙන් හා උත්සාහයෙන් කටයුතු කිරීම හේතුවෙන් තමාට මුහුණ දීමට සිදු වූ අකුසල කර්ම මගහරවා ගත්තේය. ඊට හේතු වූයේ,

1. ගති සම්පත්තියයි.
2. කාල සම්පත්තියයි.
3. උපධි සම්පත්තියයි.
4. ප්‍රයෝග සම්පත්තියයි.

35. බුදු දහමට අනුව පංචස්කන්ධය උපමා මගින් දක්වා ඇත. එහි වේදනාව උපමා කර ඇත්තේ,

1. දිය බුබුලකට.
2. පෙණ පිඩකට.
3. කෙසෙල් කඳකට.
4. මායාවකට.

36. ක්‍රෝධය උපන්විට වෛරය උපදී. ක්‍රෝධය නිවී ගියවිට වෛරය ද සංසිඳේ. මෙම සිදුවීම්වල ක්‍රියාත්මකවන ධර්මතාව වන්නේ,

1. කර්මයයි.
2. පටිච්ච සමුප්පාදයයි.
3. ත්‍රිලක්ෂණයයි.
4. පුනර්භවයයි.

37. බුදු රජාණන් වහන්සේගේ ප්‍රථම උදාන වාක්‍යයට අනුව තමන් නොයෙකුත් ආත්මභාවවල ඉපිද ජාති ජරා මරණාදී දුක්වලට මුහුණ දීමට හේතුවූයේ,

1. අනිත්‍යභාවය නිසාය.
2. කරන ලද අකුසල කර්ම නිසාය.
3. තණ්හාව නිසාය.
4. ප්‍රතිසන්ධි විඤ්ඤාණය නිසාය.

38. අකුසලයද අකුසල මූලයද, කුසලයද කුසල මූලයද අකුසලයද අකුසල විපාකයද, කුසලයද කුසල විපාකයද දැන ගන්නා ඥානය හඳුන්වන්නේ,

1. සම්මා දිට්ඨිය නමිනි.
2. සම්මා සංකප්ප නමිනි.
3. සම්මා වායාම නමිනි.
4. සම්මා සමාධිය නමිනි.

39. බුදු රජාණන් වහන්සේ මුචලින්ද විල අසල වැඩ වසන විට ඇද හැලුන වර්ෂාවෙන් ආරක්ෂා සැලසීමට මුචලින්ද නාගරාජයා ඉදිරිපත් විය. එය සිදු වූයේ,

1. දෙවන සතියේ ය.
2. තුන්වන සතියේ ය.
3. හතරවන සතියේ ය.
4. හයවන සතියේ ය.

40. අචිරවතී නදී තීරයෙහි පිහිටි අඹ වනයේ දී බුදු රජාණන් වහන්සේ දේශනා කළ සූත්‍රය වන්නේ,

1. තේවිජ්ජ සූත්‍රය.
2. අම්බට්ඨ සූත්‍රය.
3. වේදනා පරිග්‍රහ සූත්‍රය.
4. මහා සිහනාද සූත්‍රය.

(ලකුණු 1 X 4 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය 2019

## 10 ශ්‍රේණිය
## බුද්ධ ධර්මය - II

නම/විභාග අංකය :-- ..................................................................................

**පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

1. i. සිදුහත් කුමරාට ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වූ බමුණු පඬිවරයා නම් කරන්න.
   ii. බුදුන් වහන්සේගේ අරහං ගුණය හඳුන්වන්න.
   iii. දහම් ගුණවලින් දෙකක් ලියන්න.
   iv. නීවරණ යනු මොනවාද?
   v. පුද්ගල චරිත හයකි. ඉන් දෙකක් නම් කරන්න.
   vi. භාවනාව වැඩීමේ දී යොදාගත හැකි ඉරියව් හතරක් නම් කරන්න.
   vii. සිව්බඹ විහරණ නම් කරන්න.
   viii. කුසල මූලවලින් දෙකක් නම් කරන්න.
   ix. ''හේතුං පටිච්ච සම්භූතං - හේතු භංගා නිරුජ්ඣති'' යන්නෙහි අර්ථය ලියන්න.
   x. බුද්ධ කාලීන භාරතයේ විමුක්තිය ලබාගැනීම සඳහා අනුගමනය කළ අන්තගාමී පිළිවෙත් දෙක නම් කරන්න. (ලකුණු 2 x 10 = 20)

2. i. බෝසත් උපත සිදු වූ අවස්ථාවේ වෙනත් කිසිදු උපතක සිදු නොවුන අසිරිමත් සිදුවීම් කිහිපයක් සිදුවිය. ඉන් දෙකක් ලියන්න. (ලකුණු 02)
   ii. බෝසතාණන් වහන්සේ අභියෝග ජයගත් අවස්ථා තුනක් නම් කරන්න. (ලකුණු 03)
   iii. ඔබට ජීවිතයේ දී මුහුණ දීමට සිදුවන අභියෝග ජයගන්නා අයුරු පහදන්න. (ලකුණු 05)

3. i. බෞද්ධ භාවනා බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න. (ලකුණු 02)
   ii. සීලයෙන් යුතුව සමාධි භාවනාව වැඩීමේ දී පුද්ගලයකු තුළ තිබිය යුතු ගුණාංග තුනකි. ඒවා නම් කරන්න. (ලකුණු 03)
   iii. සමථ භාවනාව වැඩීමෙන් ලැබෙන ප්‍රයෝජන ඇසුරින් ඔබේ ජීවිතය සාර්ථක කරගත හැකි අයුරු විස්තර කරන්න. (ලකුණු 05)

4. i. ''උට්ඨානවතෝ සතිමතෝ ...'' ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 02)
   ii. එහි තේරුම ලියන්න. (ලකුණු 03)
   iii. ඉහත ගාථාවේ කරුණු ඇසුරින් ශිෂ්‍ය ජීවිතය සාර්ථක කරගත හැකි අයුරු විස්තර කරන්න (ලකුණු 05)

5. i. සිගාලෝවාද සූත්‍රයට අනුව දකුණු දිශාවෙන් හා යට දිශාවෙන් දැක්වෙන සමාජ කණ්ඩායම් දෙක පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 02)
   ii. එම සූත්‍රයට අනුව සේවකයාගෙන් සේව්‍යාට ඉටුකළ යුතු යුතුකම්වලින් 3 ක් ලියන්න. (ලකුණු 03)
   iii. සේව්‍ය සේවක යුතුකම් අන්‍යෝන්‍ය වශයෙන් ඉටු කිරීම ආයතනයක දියුණුවට හේතුවන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 05)

6. i. කර්මය යන්න කෙටියෙන් අර්ථ දක්වන්න. (ලකුණු 02)
   ii. විපාක දෙන ආකාරය අනුව කර්මයේ ප්‍රභේද හතරකි. ඉන් තුනක් නම් කරන්න. (ලකුණු 03)
   iii. අකුසලයෙන් වැළකී කුසලයෙහි නිරතවීමට කර්මය පිළිබඳ අවබෝධය වැදගත් වේ. අදහස් දක්වන්න. (ලකුණු 05)

7. පහත මාතෘකාවලින් දෙකකට කෙටි සටහන් ලියන්න.
   i. වැලිවිට සරණංකර හිමි
   ii. දිට්ඨධම්ම වේදනීය කර්මය
   iii. චතුරාර්ය සත්‍යය
   iv. භෝග විනාශමුඛ

(ලකුණු 5 x 2 = 10)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 10 ශ්‍රේණිය

## බුද්ධ ධර්මය I, II

### පිළිතුරු පත්‍රය

| | | | |
|---|---|---|---|
| 1. - 2 | 11. - 1 | 21. - 2 | 31. - 4 |
| 2. - 2 | 12. - 4 | 22. - 2 | 32. - 2 |
| 3. - 3 | 13. - 2 | 23. - 1 | 33. - 1 |
| 4. - 2 | 14. - 3 | 24. - 2 | 34. - 4 |
| 5. - 1 | 15. - 1 | 25. - 2 | 35. - 1 |
| 6. - 4 | 16. - 2 | 26. - 1 | 36. - 2 |
| 7. - 2 | 17. - 3 | 27. - 1 | 37. - 3 |
| 8. - 1 | 18. - 1 | 28. - 2 | 38. - 1 |
| 9. - 3 | 19. - 3 | 29. - 3 | 39. - 4 |
| 10. - 2 | 20. - 1 | 30. - 4 | 40. - 1 |

1. i. සර්වමිත්‍ර බමුණා
   ii. බුදු රජාණන් වහන්සේ රහසින්වත් පව් නොකළ නිසාත්, සියලු කෙලෙස් දුරු කළ නිසාත්, සියලු පූජාවන් ලැබීමට සුදුසු වූ නිසාත් අරහං නම් වේ.
   iii. ස්වාක්ඛාතෝ, සන්දිට්ඨිකෝ, අකාලිකෝ, ඒහිපස්සිකෝ, ඕපනයිකෝ, පච්චත්තං, වේදිතබ්බෝ, විඤ්ඤූහි (මින් දෙකක්)
   iv. සිත කිලිටි කරන, කුසල් සිත්වලට බාධා කරන සිතිවිලි, නිවන ආවරණය කරන සිතිවිලි
   v. රාග චරිත, ද්වේශ චරිත, මෝහ චරිත, ශ්‍රද්ධා චරිත, බුද්ධි චරිත, විතර්ක චරිත (මින් දෙකක්)
   vi. හිටගෙන, හිඳගෙන, සක්මන් කරමින්, සයනය
   vii. මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා
   viii. අලෝභය, අද්වේෂය, අමෝහය
   ix. හේතුවකින් හටගත් දෙය හේතුව නැති වූ විට නැතිවෙයි.
   x. කාමසුඛල්ලිකානු යෝගය, අත්තකිලමතානු යෝගය

2. i. උපත සිදු වූ විගස පියවර තැබීම, සත් පියුම් පිපීම, සිංහ නාද පැවැත්වීම
   ii. විවාහය සඳහා සුදුසු කුමරියක් තෝරා ගැනීමට ඥාතීන් ඉදිරියේ ශිල්ප දැක්වීම.
   උපත සිදු වී සත් දිනකින් මව කලුරිය කිරීමෙන් ඇති වූ අභියෝගය ජයගැනීම.
   සක්විති රජකම හා සැප සම්පත් අත්හැර පැවිදිවීම.
   රාහුල කුමරා, යශෝදරා දේවිය අතහැර අභිනිෂ්ක්‍රමණය කිරීම.
   iii. සුදුසු පරිදි ලියා ඇති පිළිතුරකට ලකුණු දෙන්න.

3. i. සමථ භාවනාව, විපස්සනා භාවනාව
   ii. ඉන්ද්‍රිය සංවරය, සති සම්පජඤ්ඤ, සන්තුට්ඨිතා
   iii. ලෝභ, ද්වේශ, මෝහාදී අකුසල් සිතිවිලි පාලනයවීම, ධාරණ ශක්තිය වැඩි වීම, සිතෙහි තෘප්තිමත්බව ඇතිවීම, අසහනය නැති වී ප්‍රසන්න පෙනුමක් ඇතිවීම, කායික රෝග පීඩා අඩුවීම, සිත එකඟවීම ආදී කරුණු ඇසුරින් ලියාඇති පිළිතුරකට සුදුසු පරිදි ලකුණු දෙන්න.

4. i. උට්ඨානවතෝ සතිමතෝ - සුචිකම්මස්ස නිසම්මකාරිනෝ
   සඤ්ඤතස්සච ධම්ම ජීවිනෝ - අප්පමත්තසස යසෝභි වඩ්ඪති
   ii. උත්සාහ වන්ත වූ මනා සිහිය ඇති, නිවැරදි දෙය පරීක්ෂා කිරීම කරන, හික්මීමෙන් යුත්, දැහැමිව ජීවත්වන තැනැත්තාගේ යසස වැඩේ.
   iii. නොපසුබස්නා උත්සාහය, යහපත් කල්පනාව, පිරිසිදුව කටයුතු කිරීම, සිතා විමසා කටයුතු කිරීම, හික්මීම, දැහැමිව ජීවත්වීම, ප්‍රමාද නොවීම යනාදි අයුරින් ලියා ඇති පිළිතුරකට උචිත පරිදි ලකුණු දෙන්න.

5. i. දකුණු දිශාව - ගුරුවරු, සිසු
යට දිශාව - සේව්‍ය, සේවක
ii. ස්වාමියාට පළමුව පිබිදීම, ස්වාමියාට පසුව නිදාගැනීම, දුන් දේ පමණක් ගැනීම, වැඩ කටයුතු ඉතා හොඳින් කිරීම, ස්වාමියාගේ ගුණ වර්ණනා කිරීම. (මින් තුනක්)
iii. ස්වාමියා විසින් සේවකයාගේ ශක්ති ප්‍රමාණයට වැඩ පැවරීම, සුදුසු පරිදි ආහාර හා වැටුප් ලබාදීම, සෞඛ්‍ය පහසුකම් සපයාදීම, මිහිරි ආහාරපාන ආදිය නිසි ලෙස බෙදාදීම, සුදුසු අවස්ථාවේ විවේක දීම යන යුතුකම් සේවකයාට ඉටුකළ යුතු අතර, සේවකයා විසින් ස්වාමියාට පළමුව පිබිදීම, පසුව නිදා ගැනීම, දුන්දේ පමණක් ගැනීම, වැඩ කටයුතු ඉතා හොඳින් කිරීම, ස්වාමියාගේ ගුණ වර්ණනා කිරීම ආදී යුතුකම් අන්‍යෝන්‍ය වශයෙන් ඉටු කිරීම තුළින් වැඩ වර්ජන ආදිය ඇති නොවීමෙන් ආයතන දියුණු වන අයුරු දක්වා ඇති පිළිතුරකට උචිත පරිදි ලකුණු දෙන්න.

6. i. සිතා මතා කරන දේ / සිතා මතා කරනු ලබන ක්‍රියා
ii. ගරුක කර්ම, ආසන්න කර්ම, ආචිණ්ණ කර්ම, කටත්තා කර්ම (මින් තුනක්)
iii. කර්මය හා එහි විපාක පිළිබඳ අවබෝධයෙන් අකුසලෙන් වැලකී කුසල් කිරීමට පෙළඹෙන අයුරු විස්තර විය යුතුය.

7. i. වැලිවිට සරණංකර හිමි
ගිහිකල නම කුලතුංග බණ්ඩාරයි. ස්වෝත්සාහයෙන් ඉගෙනුම් කටයුතු කර ඇත. පිඩුසිගා වැඩීම හේතුවෙන් පිණ්ඩපාතික සරණංකර හිමි වූ අතර, අසරණයන්ට පිහිටවීම නිසා අසරණ සරණ සරණංකර හිමි නමින් ප්‍රකට විය. උපසම්පදා කර්මය නොතිබූ යුගයක තායිලන්තයට දූත පිරිසක් යවා මෙරට උපසම්පදා කර්මය ඇති කිරීමට කටයුතු කර ඇත. මුණිගුණාලංකාරය, සාරාර්ථ සංග්‍රහය, රතනත්‍රය, ප්‍රණාමගාථා සන්නය, සතර බණවර සන්නය යන ග්‍රන්ථ රචනා කර ඇත. නිරහංකාර බව, ස්ථිර අධිෂ්ඨානයෙන් කටයුතු කිරීම ආදී ආදර්ශ ලබාගත හැක.

ii. දිට්ඨධම්ම වේදනීය කර්මය
මෙලොවදී විපාක දෙන කුසලාකුසල කර්ම දිට්ඨධම්ම වේදනීය කර්ම නමිනි. මේ කර්මය මගින් ප්‍රවෘත්ති විපාක ලැබෙන අතර, ප්‍රතිසන්ධි විපාක නොලැබේ.

ii. චතුරාර්ය සත්‍යය
බුද්ධාදී උතුමන් අවබෝධ කරගත් සත්‍යය බැවින් චතුරාර්ය සත්‍ය නම් වේ. උතුම් ඇත්ත සතර යන අරුත ඇත. දුක්ඛ ආර්ය සත්‍යය, දුක්ඛ සමුදය ආර්ය සත්‍යය, දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය, දුක්ඛ නිරෝධ ගාමිනී පටිපදා ආර්ය සත්‍යය යන චතුරාර්ය සත්‍යය. දුක පිළිබඳ උතුම් සත්‍යය, දුක හටගැනීම පිළිබඳ උතුම් සත්‍යය, දුක නැතිකිරීම පිළිබඳ උතුම් සත්‍යය, දුක නැති කිරීමේ මග පිළිබඳ උතුම් සත්‍යය ලෙසද දැක්විය හැකිය. (සුදුසු පරිදි ලියා ඇති පිළිතුරකට ලකුණු දෙන්න.)

iv. භෝග විනාශමුඛ
සිගාලෝවාද සූත්‍රයේ භෝග විනාශයට හේතුවන දොරටු හයක් දැක්වේ. ඒවා නම් නුසුදුසු වේලාවේ මංමාවත්වල ඇවිදීම, මද්‍යසාර ගැනීම, නැටුම් ගැයුම් වැයුම්හි ලොල්වීම, සූදුවෙහි යෙදීම, පව්ටු මිතුරන් ඇසුර, අලසකම යන කරුණුය.